කොළඹ විශ්ව විද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2018

දෙවන සෙමෙස්තර වාර අවසාන

**ECN 3262: මානව සම්පත් කළමනාකරණය**

කාලය - පැ දෙකයි (02)

**එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් තෝරාගෙන *ප්‍රශ්න හතරකට (04)* පමණක් පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු හිමි වේ.**

---

## I කොටස

1) I. "වේතන කළමනාකරණය" යනු කුමක්ද යන්න කෙටියෙන් හඳුන්වන්න. එය සංවේතන කළමනාකරණයෙන් (Reward Management) වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 12)

   II. වේතන කළමනාකරණය තුළින් මුදුන්පත් කරගැනීමට අපේක්ෂිත අරමුණු මොනවාද? (ලකුණු 13)

2) "වේතන කළමනාකරණ ක්‍රියාවලියේ වැදගත් පියවරක් ලෙස රැකියා ඇගයීම හැඳින්විය හැකිය".

   I. "රැකියා ඇගයීම" යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 9)

   II. රැකියා ඇගයීමේ එක් ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේදයක් බැගින් තෝරාගෙන ඔබ කැමති උදාහරණයක් ඇසුරින් එම ක්‍රමවේදයන් විස්තර කරන්න. (ලකුණු 16)

3) I. "ශ්‍රමික සබඳතා" යනු කුමක්ද යන්න කෙටියෙන් හඳුන්වන්න· එය සේවක සබඳතා වලින් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 10)

   II. "සංවිධානයක වෘත්තීය සමිතියක් ස්ථාපිත කිරීම, කළමනාකරණය වෙත අනර්ථදායක බලපෑමක් නිර්මාණය කරයි". ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? හේතු සහිතව පැහැදිලි කරන්න.

   (ලකුණු 15)

4) "වෘත්තීය සමිති ස්වභාවයෙන්ම ඇති වන්නක් නොවේ. වෘත්තීය සමිති බිහි වීමට ආයතනයේ කළමනාකාරීත්වයේ ස්වභාවය හේතු වේ". සේවකයන් වෘත්තීය සමිති ලෙස එක්සත් වීමට තීරණය කිරීමට හේතු දක්වමින් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 25)

## II කොටස

5) I. "කළමනාකරණය" අර්ථදක්වා අප කළමනාකරණය පිළිබඳ අධ්‍යනය කළ යුත්තේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 12)

II. මනා කළමනාකරණ ප්‍රවේශයන් (Management Aproaches) තුළින් ආයතනයකට අත්කරගත හැකි අවසාන ප්‍රතිපල මොනවාදැයි පැහැදිලි කරන්න . (ලකුණු 13)

6) I. "තම රාජකාරි සහ වගකීම් ඉටු කරමින් සේවකයන් සියලු දෙනාගේම හදවත් සහ සිත් දිනා ගැනීමට මානව සම්පත් කළමනාකරුට හැකියාවක් තිබිය යුතුය". මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 13)

II. "මානව සම්පත් කළමනාකරණය පිළිබඳ වගකීම සංවිධානයක සෑම කළමණාකරුවෙකු වෙතම පැතිර යයි". මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න. (ලකුණු 12)

7) "අභ්‍යන්තර සහ බාහිර බඳවා ගැනීමේ ප්‍රතිපත්තිවල වාසි අවාසි පවතින බැවින්, ආයතනයකට මෙම ප්‍රතිපත්ති දෙකෙහිම සංකලනයක් යොදාගැනීම වඩාත් යෝග්‍ය වේ". මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

8) I. "පුහුණු චක්‍රය" ඇඳ එම චක්‍රයේ අනුපිළිවෙල පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. "අධ්‍යාපනය, පුහුණුව හා සංවර්ධනය යන යෙදුම් අතර ඉහළ අන්තර් සබැඳියාවක් පැවතුනද, එම යෙදුම් අතර වෙනසක් පවතී". මෙම ප්‍රකාශය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)